# පිල්ලියාන්ගේ ඉල්ලීම

දෙමළ මහජන විමුක්ති කොටි යනුවෙන් පක්ෂයක් ලෙස ලියාපදිංචි වී ඇති පිල්ලියාන්ගේ නායකත්වයෙන් යුත් සංවිධානය පසුගිය දා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට ලිපියක් යවමින් තම පක්ෂයට ද සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සාකච්ඡාවලට සහභාගිවීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටියේ ය. ඒ ලිපියේ පිටපතක් සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන තිස්ස විතාරණ මහතාට ද එවා තිබුණි.

දෙමළ මහජන විමුක්ති කොටි පක්ෂය කියා සිටින්නේ නැගෙනහිර පළාතේ දෙමළ ජනයා නියෝජනය කරන්නේ තමන් බව ය. ඔවුන් වැඩිදුරටත් කියා සිටින්නේ නැගෙනහිර මුස්ලිම්, නැගෙනහිර සිංහල පමණක් නොව උතුරේ දෙමළ ජනයාට ද නැගෙනහිර දෙමළ ජනයා නියෝජනය කිරීමට හැකියාවක් නොමැති බව ය. එමෙන් ම ඒ පක්ෂය කියා ඇත්තේ තමන් ප්‍රජාතන්ත්‍රීය දේශපාලන ප්‍රවාහයට එක් වී ඇති බවත් දැනටමත් මඩකලපු දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට තරග කරන බවත් ය.

ඒ අතර තම දේශපාලන පක්ෂය ඉදිරියේ පැවැත්වෙන නැගෙනහිර පළාතේ පළාත් සභා මැතිවරණයේ දී තරග කරන බව ද ඔවුහු කියා සිටිති. ඒ මැතිවරණයෙන් නැගෙනහිර පළාතේ දෙමළ ජනයාගේ නියෝජිතයන් ලෙස තම පක්ෂය තෝරා පත්කරගැනීම පිළිබඳ ව තමන්ට සහතික බව පවසන දෙමළ මහජන විමුක්ති කොටි එබැවින් ජනතා නියෝජිතයන් ලෙස තමන්ට ද සහභාගි වීමට හැකිවන අයුරින් සර්ව පාක්ෂික නියෝජිත කමුටවේ කරයුතු ඒ මැතිවරණය පවත්වන තෙක් තාවකාලික ව කල්දමන ලෙස ද ඉල්ලා සිටියි.

ඒ පක්ෂයේ නායකයන් වෙනත් ප්‍රකාශවලින් කියා ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට ඇතුළත්වීමත් සමග තමන් ක්‍රමයෙන් ආයුධ අත්හරින බවත් බෙදුම්වාදය ප්‍රතික්ෂෙප කරන බවත් ය. මේ සියල්ලටත් වඩා වැදගත්වන්නේ ඔවුන් කොටි සංවිධානයට විරුද්ධවීමත් නැගෙනහිර පළාතේ දෙමළ ජනයා උතුරු පළාතේ දෙමළ ජනයාගෙන් වෙන්කර සැළකීමත් ය. අද අප රටේ ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට කොටි සංවිධානය විවිධ විජාතික බලවේගවල ආධාර සහිතව ආයුධ අතට ගෙන සිටීම ය. එබැවින් ම අද අප කළයුත්තේ කොටි සංවිධානය හමුදා මෙහෙයුම් මගින් මුළුමනින් ම පැරදවීමත් ඒ හා සම්බන්ධ සංකල්ප හා ප්‍රවාද මතවාදී ක්ෂෙත්‍රයෙහි පරාජය කිරීමත් ය.

උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ ඊනියා නිජභූමි යැයි 1976න් පසුව චෙල්වනායගම් මහතාගේ නායකත්වයෙන් තිබු දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ විසින් ප්‍රකාශ කරනු ලැබීම හා ඒ පිළිබඳ ව්‍යාජ ඉතිහාසයක් හා භූගෝලයක් ගොඩනැගීමට දෙමළ හා බටහිර උගතුන් ක්‍රියාකිරීම අපට මුහුණ පෑමට සිදු වූ අභියෝග විය. ඉතිහාසයේ පළමුවරට චෙල්වනායගම් මහතා උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ජනයා එක් දේශපාලන මතවාදයක් යටතේ එකතුකිරීමට සමත්විය. ඔහු එතැනින් නොනැවතී කඳුකරයේ දෙමළ ජනයා ද උතුරු හා නැගෙනහිර පළාත්වල ද ඇතුළුව රටේ සෑමතැනකම වාසය කරන මුස්ලිම් ජනයා ද  තම පක්ෂ නායකත්වය යටතෙහි එක්කිරීමට කටයුතු කෙළේ ය. ඒ සියල්ලන් ඔහු විසින් හඳුන්වනු ලැබුයේ දෙමළ කතාකරන ජනයා ලෙස ය.

මතවාදී ක්ෂෙත්‍රයෙහි නිජභූමි සංකල්පය පරාජය වී තරමක කාලයක් ගෙවී ගොස් ය. ඒ සංකල්පය එලෙස පරාජය කිරීමට කිහිප දෙනෙක් ම දායක වූහ. කොටි සංවිධානය විසින් ඝාතනය කරනු ලැබූ නීලන් තිරුචෙල්වම් මහතා මියයෑමට ටික කලකට පෙර නිජභූමි සංකල්පය අත්හැරියේ ය. එහෙත් කොටි සංවිධානයට නැගෙනහිර පළාතේ සහයෝගයක් තිබෙන තාක් දේශපාලන ක්ෂෙත්‍රයෙහි නිජභූමි සංකල්පය හොල්මන් කෙළේ ය. කෙසේ වුවත් උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ජනයා අතර වෙනස කෘත්‍රිම ව දිගින් දිගට ම වසන්කිරීමට ප්‍රභාකරන්ට නොහැකි විය. අද අපට ඉතාමත් ම වැදගත් වන්නේ මේ වෙනස ය.

මේ පළාත්වල දෙමළ ජනයාගේ සම්භව වෙනස් ය. උතුරු පළාතේ දෙමළ ජනයාගෙන් බහුතරය පැවතෙන්නේ ලන්දේසීන් විසින් කෝරමණ්ඩල වෙරළින් මෙරටට ගෙන්වනු ලැබූ කෘෂිකාර්මික කම්කරුවන්ගෙනි. එහි දෙමළ

© Prof. Nalin De Silva

ජනයාගෙන් ඉතා විශාල පිරිසක් වෙල්ලාල නමින් හැඳින්වෙන කුලයට අයත්වෙති. බටහිරයන් දකුණු ඉන්දියාවෙන් දෙමළ ජනයා විවිධ රටවලට කම්කරුවන් ගෙන යෑම එකල සුලභ අත්දැකීමක් විය. එයට හේතුවක් වූයේ දෙමළ කම්කරුවන් ඉතා කීකරුව වහළුන් මෙන් බටහිරයන්ට සේවය කිරීම ය.

මේ සම්බන්ධයෙන් මෑත දී චින්තන පර්ෂදයේ සාමාජිකයකු අතට පත්වූ වැදගත් ලිපියක් වෙයි. ඒ ලිපියෙහි දකුණු අප්‍රිකාවේ නටාල් ප්‍රදේශයෙහි කුල ක්‍රමය ගැන අධ්‍යයනයක් කෙරෙයි. එහි ද වෙල්ලාල නමින් කුලයක් වෙයි. ඒ කුලයේ ජනයා එහි දන්නේ හා වෙල්ලාල යන්න පරිවර්තනය කෙරී ඇත්තේ කෘෂිකාර්මික කම්කරුවන් (ඇග්‍රිකල්චරල් ලේබරරස්) ලෙස ය. ලංකාවට ද වෙල්ලාලයන් ගෙන්වා ඇත්තේ දුම්කොළ වැවීම සඳහා කෘෂිකාර්මික කම්කරුවන් ලෙස බව පැහැදිලි ය. එහෙත් යාපනය ප්‍රදේශයෙහි වෙල්ලාලයන් බහුතරය වීම හා එහි විසූ සිංහලයන් පීඩනයට හසුකිරීමට ලන්දේසීන්ට වූ වුවමනාව හේතුකොටගෙන වෙල්ලාලයන් කෘෂිකාර්මික කම්කරු තත්වයෙන් ඊනියා උසස්වීමකට ලක්කෙරී ගොවි කුලයක් බවට පත්කෙරී ඇති බව පැහැදිලි ය. නටාල් ප්‍රදේශයෙහි කෘෂිකාර්මික කම්කරුවන් යාපනයේ දී ගොවීන් බවට පත්වන්නේ එ පරිදි ය.

අනෙක් අතට නැගෙනහිර පළාතේ දෙමළ ජනයාගේ සම්භවය ඉංගිරිසි පාලන සමයෙන් පටන් ගැනෙයි. ඔවුහු ද කම්කරුවන් ලෙස වැඩකිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් ආනයනය කරනු ලැබූහ. මේ වන විට ඊනියා කුලීනයන් බවට පත්ව සිටි වෙල්ලාලයෝ නැගෙනහිර පළාතේ දෙමල ජනයා පාගාදැමීමට කටයුතු කළහ. චෙල්වනායගම් මහතා බෙදුම්වාදී  ව්‍යාපාරය ආරම්භ කරන කාලයේ දීත් මඩකලපු දෙමළ ජනයා යාපන දෙමළ ජනයාගේ පරිභවයට ලක්වූහ. චෙල්වනායගම්  මහතා මේ කුල පීඩනය මැදින් ගොස් විවිධ දෙමළ ජනවර්ග එකතුකෙළේ හින්දු සංස්කෘතික බැමි බුරුල් කිරීමට තම ක්‍රිස්තියානි සංස්කෘතිය යොදා ගැනීමෙනි.

එහෙත් ඒ ඉතා තාවකාලික සංසිද්ධියක් පමණක් විය. වැඩිකල් නොගොස් කොටි සංවිධානයෙහි උතුර හා නැගෙනහිර වෙන්විය. කරුණා අම්මන් නමින් හැඳින්වෙන තැනැත්තා කෘත්‍රිම එකතුකිරීම බිඳ දැමීමට පළමු පියවර ගත්තේ ය. කොටි සංවිධානයෙහි සාමාජිකයකු වූ කාලයෙහි ඔහු අරන්තලාවෙහි භික්ෂූන් වහන්සේ ඝාතනය කිරීමට නිරායුධ පොලිස් භටයන් හත්සීයක් පමණ ඝාතනය කිරීමට නායකත්වය දුන්නේ ය. ඒ අතර තවත් මිනීමැරුම් රාශියකට සහභාගි වී ඇත. අපට ඒ කිසිවක් අමතක නො වෙයි. එසේ වුවත් නැගෙනහිර පළාතේ ජනයා නැවත වරක් උතුරෙන් ස්වාධීන කරගැනීමට ඔහු ගත් පියවර අපට වැදගත් වෙයි. අද කරුණා එංගලන්තයෙහි ය. ඔහු කොටි සංවිධානයෙන් කැඩී පිහිටුවාගත් පක්ෂයට අද නායකත්වය දෙන්නේ පිල්ලියාන් ය.

උතුර කේන්ද්‍ර කරගත් දෙමළ දේශපාලන පක්ෂ මෙන් නොව පිල්ලියාන්ගේ නායකත්වයෙන් යුත් පක්ෂය අද නියෝජනය කරන්නේ නැගෙනහිර පළාතේ දෙමළ ජනයා පමණ ය. ජ්ලොට් ඊපීඩීපී ආදී පක්ෂ තමන් උතුරු පළාතේ මෙන් ම නැගෙනහිර පළාතේ ද දෙමළ ජනයා නියෝජනය කරන්නේ යැයි කියයි. එහෙත් ඒ පක්ෂවල නායකයෝ උතුරෙන් ම පත්වෙති. කරුණා හා පිල්ලියාන් නැගෙනහිරින් ම බිහි වී ඇති අතර ඔවුන්ගේ පක්ෂය නැගෙනහිර පළාතේ දෙමල ජනයා පමණක් නියෝජනය කරයි.

ඒ පක්ෂය නැගෙනහිර පළාතේ පළාත් සභා ඡන්දයෙන් ජයගනී ද නැත් ද යන්න අපට කිව නොහැකි ය. එහෙත් ඔවුන් ජයගතහොත් ඔවුන්ට පාර්ලිමේන්ත නියෝජනත්වයක් නැතිවුවත් පළාත්සභා නියෝජනත්වයක් ලැබෙයි. එවැවින් හා නැගෙනහිර පළාත උතුරු පළාතෙන් වෙන් වූ වෙන ම දේශපාලනයක් ඇති වෙන ම පළාතක් ලෙස සැලකීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන තමන්ට සර්වපාක්ෂික නියෝජිත කමිටුවට සහභාගිවීමට ඉඩදෙන ලෙසට පිල්ලියාන් කරන ඉල්ලීමට එකඟවීම දේශපාලන වශයෙන් වැදගත් ය. එසේ වුවත් සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට සහභාගිවන්නේ කවුදැයි තීරණය කිරීමේ බලය ඒ කමිටුවට නැත. ඒ බලය ඇත්තේ සර්ව පාක්ෂික කමිටුවට ය. ජාතික හෙළ උරුමය හා මහජන එක්සත් පෙරමුණ කියා ඇත්තේ සර්ව පාක්ෂික කමිටුව කැඳවා ඒ පිළිබඳ තීරණයක් ගන්නා ලෙස ය. ඒ තීරණය ගන්නා තෙක් ඒ පක්ෂ දෙක සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ රැස්වීම්වලට සහභාගි නොවන බව ද ඒ කමිටුව ඉදිරියේ එහි නියෝජිතයන් ප්‍රකාශ කර ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva